(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 71.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 පෙබරවාරි මස 08 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0053/’10

1.

ගරු රාජීව විජේසිංහ මහතා,—මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) රාජ්‍ය නොවන සංවිධානවලට සහ පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කර ඇති සමාජ සේවා කටයුතුවල යෙදෙන ආයතනවලට ලැබෙන විදේශ අරමුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(ii) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී ඇති සමාජ සේවා හෝ පර්යේෂණ හෝ උපදේශන කටයුතුවල යෙදෙන සමාගම්වලට ලැබෙන විදේශ මුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(iii) මෙම සමාගම් නීතියෙන් නියමකර ඇති පරිදි තම ලැබීම් ඉදිරිපත් කරන්නේද, බදු ලිපිගොනු පවත්වාගෙන යන්නේද සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් මත බදු ගෙවීම් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1999 සහ 2010 අතර වර්ෂ 2010 ඇතුළත් කාලසීමාව තුළ ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට බාහිර මූලාශ්‍රවලින් ලැබුණු අරමුදල් සහ එම අරමුදල් භාවිතා කළ කාරණා කවරේද;

(ii) මෙම අරමුදල් ලබාගත් හේතු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කළේද;

(iii) මෙම අරමුදල් භාවිතා කිරීම ආණ්ඩුවේ කිසියම් නියෝජිතායතනයක් මගින් අධීක්ෂණය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0344/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වර්ෂ 2005 සිට 2009 දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 දිනට හිමිකම් ලබමින් සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ආ) (i) වර්ෂ 2005 සිට 2009 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධිලාභීන් වෙනුවෙන් වාර්ෂිකව වෙන් කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2009 දක්වා කාල සීමාවේදී පඩුවස්නුවර නැගෙනහිර හා බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සමෘද්ධිලාභීන්ව සිට ඉවත් කරන ලද අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම පුද්ගලයන් ඉවත්කරන ලද පදනම කුමක්ද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකහි සමෘද්ධිලාභීන් ලෙස අලුතින් එක් කරන ලද අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0430/'10

3.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එක් එක් ආයතනය සඳහා අද වන විට ආයෝජනය කර ඇති ප්‍රාග්ධන ප්‍රමාණය සඳහන් කරමින්, රජයට අයත් සියලු ආයතනවල නම් කවරේද;

(ii) පසුගිය වර්ෂ තුනක කාලය තුළදී එකී ආයතනවල සේවය කළ පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත (අ) (i) හි සඳහන් ආයතනවල පසුගිය වර්ෂය සඳහා එක් එක් ආයතනයේ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) (අ) (i) හි සඳහන් මුළු ආයතන සංඛ්‍යාවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා නොකරන සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ වාර්තා නොකිරීමට හේතුව කවරේද;

(iii) එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය උල්ලංඝනය කිරීමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0572/'10

4.

ගරු අජිත් කුමාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අංක 06/2006(iv) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විද්‍යුත් වෛද්‍ය කාර්මික විද්‍යාඥ හා වැඩ මූලික (විශේෂ) යන තනතුරු සඳහා කේත අංක MN - 7 - 2006 A ට අදාල වැටුප ගෙවන ලෙස අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) විසින් අංක BES/පුලි/විවිධ 99 1 හා 2009.08.25 දිනැති ලිපියෙන් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල වෙත දන්වා ඇතත් එම රෝහලේ ඉහත කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන්නේ කේත අංක MT2-2006 A දරන අඩු වැටුප් තලය බවත්;

(ii) එම කාර්ය මණ්ඩලයට වඩා අඩු වැටුප් තලයක සිටි සිවිල් (විදුලි, ගොඩනැගිලි) වැඩ මූලික (Foreman) තනතුරු සඳහා කේත අංක MN - 7 - 2006 A වැටුප ගෙවන බැවින් වැටුප් විෂමතාවයක් ඇති වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත රෝහලේ ඇති සියලුම වෛද්‍ය උපකරණ (Medical Equipments) හා විකිරණ යන්ත්‍ර (X Ray Machine) නඩත්තුව වැනි අත්‍යවශ්‍ය සේවාවන් ඉටුකරනු ලබන මෙම විද්‍යුත් වෛද්‍ය කාර්මික විද්‍යාඥ කාර්ය මණ්ඩලය නිර්දේශිත වැටුප් තලයේ පිහිටුවා ඔවුන්ට හිමි හිඟ වැටුප් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0787/'10

5.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නැගෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසවල නේවාසිකව සිටින වැඩිහිටියන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වැඩිහිටි නිවාසවල නේවාසිකයන් වෙනුවෙන් රජය මගින් සපයනු ලබන පහසුකම් හා සේවාවන් කවරේද;

(iii) එම නිවාසවල පහසුකම් සපයාදීම සඳහා රජය මගින් වර්ෂයකට වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් දිස්ත්‍රික්කයේ වැඩිහිටි නිවාසයන්හි පහසුකම් හා සේවාවන් ඉහළ නැංවීම උදෙසා රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ පිළිවෙළ කුමක්ද;

(ii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0873/'10

6.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමෘද්ධිලාභීන් සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට වර්ෂ 2004 දක්වා සහ 2010 වර්ෂයේදී එම වැඩ සටහන මගින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සවිබල ගැන්වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) සමෘද්ධි සහනාධාරය වෙනුවෙන් 2010 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් නියමිත වේලාවට සමෘද්ධිලාභීන්ට ලබාදී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0876/'10

7.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තිහාරිය, බණ්ඩාරනායක පෙදෙස, අංක 569/49බී දරන නිවසේ පදිංචි එම්. ජේ. එම්. උවයිස් මහතා සහ ඔහුගෙන් යැපෙන්නෙකු වන වයෝවෘද්ධවූ ඒ. සී. නූර් නයිමා (වයස අවු. 75 යි) යන අයවලුන් අඩු ආදායම්ලාභී පවුලක සාමාජිකයින් වුවත්, ඔවුන්ට මෙතෙක් සමෘද්ධි සහනාධාරය ලබාදී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) ජීවත්වීමට ස්ථිර රැකියාවක් නොමැතිව නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ ජීවත්වන උවයිස් මහතාට සහ ඔහුගේ යැපෙන්නන් වෙත නොපමාව සමෘද්ධි සහනාධාර ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0484/'10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම සිට මන්නාරම දක්වා ප්‍රදේශයේ සුළං බලයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා කිසියම් වැඩ පිළිවෙළක් සකස්කොට තිබේද;

(ii) එසේ නම්, ඇස්තමේන්තු අනුව එම ව්‍යාපෘතිය සඳහා වැයවන මුදල කොපමණද;

(iii) එයින් ජනනය කිරීමට අපේක්ෂිත විදුලිය ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට ඉල්ලුම්කරුවන් කිසිවකු සිටින්නේද;

(ii) එසේ නම්, එම ආයතන හා ඒවා අයත් රටවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0579/'10

9.

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සංචාරක ව්‍යාපාරය යන විෂය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විෂයය පථයට අයත්වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුරය, යාපනය, ත්‍රිකුණාමලය, මාතර, මඩකලපුව, පුත්තලම සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වෙමින් පවතින සංචාරක හෝටල් සංඛ්‍යාව තරු පන්ති පදනම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වර්ෂයකට, ඉහත කී හෝටල්වල කුලියට දීම සඳහා තිබෙන කාමර සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත කී ප්‍රදේශවල තිරසාර සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් ඇති කරන්නේ කෙසේද;

(ii) ශ්‍රී ලංකාවේ සංචාරක අංශය ප්‍රවර්ධනය කිරීම උදෙසා 2010/2011 වර්ෂ තුළ යොදවන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0788/'10

10\.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නැගෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) පවත්වාගෙන යනු ලබන ළමා නිවාසවල නේවාසිකව සිටින ළමුන් සංඛ්‍යාව;

(ii) එම නේවාසික ළමුන් වෙනුවෙන් රජය මගින් සපයනු ලබන පහසුකම් හා සේවාවන්;

(iii) එම නිවාසවල පහසුකම් සපයාදීම සඳහා රජය මගින් වර්ෂයකට වැය කරනු ලබන මුදල;

කොපමණද යන්න, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් දිස්ත්‍රික්කයේ ළමා නිවාසයන්හි පහසුකම් හා සේවාවන් ඉහළ නැංවීම උදෙසා රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ පිළිවෙළ කුමක්ද;

(ii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0857/'10

11\.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාතෙහි, පළාත් සභාවට හා මධ්‍යම රජයට අයත් ගුරුවරුන් සඳහා ගෙවිය යුතු හිඟ වැටුප් පිළිබඳව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අධ්‍යයනයක් කර තිබේද;

(ii) එසේ නම්, එම අධ්‍යයනය අනුව දකුණු පළාතේ ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවීමට තිබේද;

(iii) එසේ හිඟ වැටුප් ගෙවීමට තිබේ නම්, 2010.01.01 දින වනවිට ඒ ඒ අධ්‍යාපන කලාප මට්ටමෙන් දකුණු පළාත් ගුරුවරුන්ට ගෙවීමට ඇති හිඟ වැටුප් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත හිඟ වැටුප් ගෙවීමට රජය මගින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ වෙන්කර නැත්නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හිඟ වැටුප් නොගෙවීමෙන් එම ගුරුවරුන්ට අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0538/'10

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය - පුල්මුඩේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0596/'10

13

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ මුළු තත්‍ය වියදම (ශුද්ධ ආර්ථික බදු වලය) කොපමණද;

(ii) ඍජු හා වක්‍ර බදු මගින් රජය උපයාගත් ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් කොපමණද;

(iv) රටේ දළ දේශීය නිෂ්පාදිතය කොපමණද;

(v) රජයේ අයවැය හිඟය කොපමණද;

යන්න පසුගිය වර්ෂ දහයට අදාළව, වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එය පියවාගන්නේ කෙසේද සහ අයවැය හිඟය පියවාගැනීම සඳහා ලබාගත් ණය සඳහා වන පොලී පිරිවැය ලබා දෙන්නේ කෙසේද;

(ii) මෙම ජීවනරටාව තවදුරටත් ඉදිරියට ගෙන යාමට හැකිවන්නේද සහ රට ණය උගුලක් කරා ගමන් කරමින් සිටින්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර (සංශෝධන),— 1980 අංක 26 දරන ආහාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 8.30 දක්වා විය යුතුය. අ. භා. 6.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

4.

ගරු විජයදාස රාජපක්ෂ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මහමෙව්නාව සදහම් සේවාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකාවේ සියලුම දරුවන්ට නිදහස් අධ්‍යාපනයට ප්‍රවේශයක් ලබාදීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

6.

ගරු තාරානාත් බස්නායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"එස්. බී. නාවින්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2011 පෙබරවාරි මස 03 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 නොවැම්බර් 22 දිනැති, අංක 1681/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 දෙසැම්බර් 24 දිනැති, අංක 1685/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

*7.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.